**හැටන් නුවරඑළිය මාර්ග වැඩිදියුණුකිරීමේ ව්‍යාපෘතිය - 2017**

---

හැටන් නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල අතර 2010 නොවැම්බර් 02 දින එළඹි අංක එස්ආර්අයි 20 ණය ගිවිසුම සහ 2015 ජුනි 22 දින එළඹි අංක එස්ආර්අයි 26 දරන පරිපූරක ණය ගිවිසුමේ විධිවිධානයන් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථයන් වන්නේ, වෙළඳපල වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාවගේ රැකියා අවස්ථා සහ සමාජ සේවා සැපයීම මඟින් සමාජ ආර්ථික වර්ධනය හා සංවර්ධනය උත්තේජනය කිරීමයි. එබැවින් හැටන්-නුවරඑළිය මාර්ගයේ කිලෝමීටර් 35.6 ක් වැඩිදියුණු කිරීමටත් නානුඔය උමං දුම්රිය පාලම සහ කොටගල උමඟ ඉදිකිරීමටත් යෝජනා විය.

ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 9,061 ට සමාන එ.ජ.ඩො.මිලියන 70.40 ක් වූ අතර ඉන් රු.මිලියන 7,049.37 කට සමාන එ.ජ.ඩො.මිලියන 57.14 ක් ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල මඟින් ලබාදීමට එකඟ විය. තවද, ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල විසින් මෙයට අමතරව රු.මිලියන 2,010.2 ට සමාන එ.ජ.ඩො. මිලියන 17 ක පරිපූරක ණය මුදලක් නානුඔය උමං මාර්ගය හා කොටගල උමං මාර්ගය ඉදිකිරීමේ අමතර වැඩ සඳහා වූ පිරිවැය සහ මිළ ඉහළයාමේ පිරිවැය වෙනුවෙන් වෙන් කරන ලදී.

තවද, පරිපූරක ණය යටතේ වෙන්කර ඇති ඉතුරුම් මඟින් කිලෝමීටර් 68.5 සිට කිලෝමීටර් 72 දක්වා වූ අවිස්සාවේල්ල - හැටන් මාර්ගය වැඩිදියුණු කිරීමට යොදා ගැනීමට තීරණය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2011 දෙසැම්බර් 01 වන දින සිය කටයුතු ආරම්භ කරන ලද අතර එය 2015 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය යටතේ වැඩවල විෂයපථය වෙනස්වීම හේතුවෙන් ව්‍යාපෘති කාලය 2016 ජනවාරි 31 දක්වා දීර්ඝ කර ඇත. අත්පත් කරගත් ඉඩම් කට්ටි සඳහා වන්දි ගෙවීමට කරන ලද හිමිකම් පියවීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල

අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණන සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලනයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘතියේ වියදම්,මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණයවලින් මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයන්ට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේ ද යන බව,

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳව තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවත්‍ය.

## 3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද ප්‍රතිපාදනය | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ | **2017** දෙසැම්බර් **31** දිනට |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල | 57.14 | 7,049.37 | - | - | 7,240.73 |
| ශ්‍රී ලංකා රජය | 13.26 | 2,011.63 | 50.66 | 18.53 | 221.28 |
| මාර්ග සංවර්ධන අධිකාරියේ විශේෂ දීමනා | - | - | - | - | 33.84 |
| එකතුව | 70.40 | 9,061.00 | 50.66 | 18.53 | 7,495.85 |

### 3.2 භෞතික කාර්ය සාධනය

---------------------------

ලැබුණු තොරතුරුවලට අනුව, හැටන් - නුවරඑළිය මාර්ගයේ කිලෝමීටර් 35.60 ක කොටසෙහි පුනරුත්ථාපන කටයුතු සහ නානුඔය උමං පාලම සහ කොටගල උමං මාර්ගය ඉදිකිරීමේ කටයුතු 2015 මාර්තු 02 වන විට අවසන් කර මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි. ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 3,767.69 ක් වූ අතර පසුව ව්‍යාපෘතියේ වැඩ විෂය පථයේ වෙනස්වීම හේතුවෙන් රු.මිලියන6,747.17 ක් දක්වා වැඩි කර තිබුණි. තවද, අවිස්සාවේල්ල හැටන් පාරේ කිලෝමීටර් 68.50 සිට කිලෝමීටර් 72 දක්වා කොටසෙහි අමතර වැඩ කටයුතු ද 2015 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි.

**3.3 ඉඩම් අත්පත් කර ගැනීම**

----------------------------

2011 දී ආරම්භ කරන ලද ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර ඇති අතර ඉඩම් කට්ටි 1,322 කින් ඉඩම් කැබලි 685 ක නෛතික අයිතිවාසිකම් 2017 දෙසැම්බර් 31 දින වන විට පවරා ඇත. තවද, වන්දි ගෙවීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට පොලී වශයෙන් රු. මිලියන 2.48 ක් ගෙවා තිබුණි.

**3.4 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වසා දැමීම**

-----------------------------------------

ව්‍යාපෘතියේ කටයුතු 2015 දෙසැම්බර් 31 වන විට අවසන් කර තිබුණද, ව්‍යාපෘතියේ වත්කම් හා වගකීම් අදාල ක්‍රියාත්මක කිරීමේ ආයතනවලට භාරදෙන ලෙසත්, ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ මෙහෙයුම් කටයුතු 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කරන ලෙසත් ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් උපදෙස් ලබාදී නොතිබුණි.